තේ ශක්ති අරමුදල 2012
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 අහිතකර මතය
-----------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
--------------------------------------

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු. 74,048,541 ක මුදලක් භාණ්ඩාගාරයේ එකගත්වය මත ලියා හැරීමට අධිකාරිය සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර තිබුණි. අරමුදල විසින් මෙම මුදල අතීතානුයෝගීව ගැළපීම කරනු වෙනුවට වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාරය විසින් තේ ශක්ති අරමුදලට 1998 සිට 2002 වර්ෂය දක්වා සහ 2004 වර්ෂවල ප්‍රාග්ධන දායකය ලෙස ලබා දී තිබුණු රු. 437,505,030 ක මුදල අතීතානුයෝගීව ගැළපීම වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරි වර්ෂ 10 කින් කපා හැරීමට ගත් තීරණයක් මත සමාලෝචිත වර්ෂයේදී රු. 43,750,503 ක් වෙනත් ආදායම් යටතේ ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉදිරි වර්ෂයට ලැබුණු රු.72,500 ක බදු කුලිය සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි.

(ඈ) ගිලීමලේ කම්හල බදු දීමට පෙර එහි තිබුණු වර්ණ විභේදන යන්ත්‍රය නිසි ක්‍රියාකාරීත්වයට පත් කර දීමට අරමුදල එකග වී තිබුණද එසේ නොකිරීම හේතුවෙන් බදු ගැනුම්කරු විසින් සමාලෝචිත වර්ෂයේදී දැරූ රු.250,834 ක අලුත්වැඩියා වියදම වූ රු.250,834 ක් වගකීමක් ලෙස ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි. තවද අලුත්වැඩියා කළ මෙම වර්ණ විභේදන යන්ත්‍රයේ වටිනාකම 2012 දෙසැම්බර් 31 දිනට වූ බදු දේපල (Investment ) යටතේ දක්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.1,717,612 ක බෑග් තොගයක් (wppbags)තේ තොග වටිනාකමටද, පිරිවැය රු.971,531 ක් වූ භාවිතයට ගත නොහැකි පොලිතීන් තොගයක් ලිපි ද්‍රව්‍ය තොගයටද ඇතුළත් කර තිබුණි.

(ඊ) වසර පහකට පෙර සිට රු.9,700,079 ක බැංකු අයිරාවක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණු නමුත් එකී ශේෂය තහවුරු කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. කරන ලද විගණන පරීක්ෂණයට අනුව මෙම ගිණුම අක්‍රීය ගිණුමක් බව නිරීක්ෂණය වූ නමුත් එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.2.2 නොසැසඳූ ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති අක්‍රීය බැංකු ගිණුම් තුනක ශේෂයන් අදාල බැංකු ශේෂ සනාථ කිරීම් සමග සැසඳීමේදී රු.1,201,619 ක වෙනසක් තිබුණි.

(ආ) පරිගණක ගිණුම් පද්ධතියක් පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණද බැංකු සැසඳුම් විස්තර පිළියෙල කිරීමේදී අතින් ලියූ (manual) මුදල් පොත් ශේෂය පදනම් කර ගෙන තිබුණි. මෙම ක්‍රම දෙකේදී මුදල් පොත් දෙකක ශේෂයන්හි සමාලෝචිත වර්ෂය අවසානයට රු. 16,801,672 ක වෙනසක් නිරූපනය වූ බැවින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් බැංකු ශේෂවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| <u>බැංකු ගිණුම්</u> | | |
| කම්මල් කළමණාකරණ අංශය | 875,864 | බැංකු ශේෂ සනාථ කිරීම් |
| ලැබිය යුතු / ගෙවිය යුතු ශේෂ | | |
| ලැබිය යුතු ශේෂ | 241,447,793 | විස්තරාත්මක තොරතුරු හා ශේෂ සනාථ කිරීම් |
| ගෙවිය යුතු ශේෂ | 205,106,116 | |
| අත්තිකාරම්ශේෂ | 38,078,755 | |
| තැන්පතු ශේෂ | 5,053,841 | |

**1.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිලීමලේ තේ කම්හල 2012 මැයි 17 දින සිට බදු පදනම මත කුඩා තේ වතු සංවර්ධන සමිතියකට පවරා දෙන අවස්ථාවේදී පැවති රු.6,209,334 ක ජංගම වත්කම් හා රු.5,034,324 ක ජංගම වගකීම් ශේෂ නිරවුල් කිරීමකින් තොරව තවදුරටත් ගිණුම්වල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) 2006 හා 2007 වර්ෂවල කොළඹ තේ තැරැව්කාර සමාගමකින් ලැබියයුතු රු. 19,744,732 ක මුදල විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වර්ෂ ගණනාවක සිට අය විය යුතුව පැවති රු.28,311,753 ක අත්තිකාරම් මුදල් විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 30 දින වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(ඈ) බදු පදනම මත පවත්වාගෙන ගිය පන්සල්තැන්න තේ කම්හල අලාභ ලැබීම හේතුවෙන් 2012 පෙබරවාරි 19 දින නැවත බදුහිමි සමාගමට පවරා තිබුණු නමුත් එදිනට පැවති ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ ගිණුම් නිරවුල් නොකිරීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.3,387,202 ක ලැබිය යුතු ශේෂ හා රු.7,956,886ක ගෙවිය යුතු ශේෂ තව දුරටත් ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර එම කම්හලට විදුලිය ලබාගැනීමට විදුලිබල මණ්ඩලයෙහි තැන්පත් කළ රු. 258,491 ක මුදල් අයකර ගෙන නොතිබුණි. තවද 2011 අගෝස්තු මස සිට නිෂ්පාදන කටයුතු නැවතූ බලංගොඩ තේ කම්හලෙහි වත්කම් හා බැරකම් නිරවුල් නොකිරීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.3,829,720 ක ලැබිය යුතු ශේෂ හා රු.2,176,440 ක ගෙවිය යුතු ශේෂ ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට හිනිදුම තේ කම්හල සී/ස කලුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට පවරා තිබුණද වටිනාකම රු.1,288,937 ක ලැබිය යුතු ශේෂ හා රු.1,155,726 ක ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ලැබිය යුතු ශේෂ ලෙස ඉදිරියට ගෙන එමින් පැවති රු. 7,521,752 ක් දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින බැවින් එම වටිනාකම් එකිනෙක හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත | |
| | (i) 03 වගන්තියේ 2(iii)ඡේදය | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) නිලබලයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්විය යුතු බව සඳහන් වුවද එවැනි තනතුරක් අධිකාරියේ නොමැති බැවින් ඒ වෙනුවට සාමාජිකයකු පත්කර නොතිබුණි. |
| | (ii) 03 වගන්තියේ 2(v) ඡේදය | වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කළ යුතු වුවත් ඒ වෙනුවට අමාත්‍යාංශයේ උපදේශකවරයකු අධ්‍යක්ෂ |

මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කර තිබුණු අතර ඊට අමතරව අමාත්‍යාංශය නියෝජනය කිරීමට එහි නිලධාරියෙකු නිරීක්ෂක සාමාජිකයකු ලෙස පත්කර දීමනා ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
--------------------------------------------

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(2)(ආ) | අත්තිකාරම් මුදල් ලබාදීමේදී යම් නිශ්චිත සීමාවන් පනවා නොතිබුණු අතර විගණන නියැදි පරීක්ෂාවකදී රු. 20,000 සිට රු. 155,000 දක්වා අත්තිකාරම් මුදල් අවස්ථා 08 කදී ලබා දී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | නිලධාරීන් වෙත අත්තිකාරම් මුදල් ලබාදීමේදී යම් නිශ්චිත කාර්යයක් සඳහා මුදල් ලබා දියයුතු වුවත් නිලධාරීන් දෙදෙනෙකු ලබා ගෙන තිබුණු රු.58,250 ක අත්තිකාරම් මුදල් ලබාගත් කාර්යයන්ට නොයොදවා සැලකියයුතු කාලයක් අත රඳවා තබාගෙන පසුව පියවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 395 (ඇ) | අරමුදලේ බැංකු ගිණුම් 04 ක් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් පිළියෙලකර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 396 | නිකුත්කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ වටිනාකම රු. 96,497 ක් වූ මාස 06 ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය - 6.5.1 වගන්තිය | (i) මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ගිණුම් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු වුවත් 2012 වර්ෂය සඳහා වූ ගිණුම් ඉදිරිපත් කරන ලද්දේ 2014 මාර්තු 18 දිනදීය.<br>(ii) චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2014 දෙසැම්බර් 31 දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් පරිදි මෝටර් වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |

**2. මූල්‍යසමාලෝචනය**

**2:1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ සමස්ත ලාභය රු.82,199,299 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.85,696,151 ක් විය. එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී රු.167,895,450 ක එනම් සියයට 195.92 ක වර්ධනයකි. කෙසේ වෙතත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.74,048,541 ක් ආයතන දෙකෙහි එකඟත්වයෙන් නොගෙවීමට තීරණය කිරීම හේතුවෙන් එම මුදල ආදායමට එකතු කිරීමත් 1998 සිට 2002 දක්වා රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.437,505,030 න් රු.43,750,503 ක් හා නොගෙවිය යුතු විවිධ ණය ශේෂ සඳහා වෙන් කිරීම වූ රු. 6,878,128 ක් ලාභයට එකතු කිරීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3:1 කාර්යසාධනය**

(අ) කම්හල් අංශය

2012 වර්ෂයේ කම්හල් ලාභාලාභ ගිණුමට අනුව අරමුදලේ සමස්ථ කර්මාන්තශාලා අලාභය (ප්‍රධාන කාර්යාලයේ වියදම් හැර) රු.මිලියන 57.695 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ අලාභය වූ රු.මිලියන 73.600 හා සැසඳීමේදී,රු. මිලියන 15.905 කින් එනම් සියයට 21.6 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වතු ආදායම් (Field income)රු.මිලියන 1.824 කින් එනම් සියයට 31.6 කින් වැඩිවී තිබීමද, කර්මාන්තශාලා දළ ලාභය රු.මිලියන 16.091 කින් එනම් සියයට 24.9 කින් වැඩි වී තිබීමද ප්‍රධාන වශයෙන් මෙයට හේතුවී වී තිබුණි.

2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එක් එක් කර්මාන්තශාලාව ලැබූ ලාභය/ (අලාභය) පහත දැක්වේ.

| කම්හල | ලාභාලාභ තත්ත්වය රු.'000 | | | | |
|---|---|---|---|---|---|
| | **2012** | **2011** | **2010** | **2009** | **2008** |
| දෙනියාය | (7,349) | (4,126) | 1,054 | 7,913 | 6,709 |
| වලහන්දුව | (2,297) | (3,312) | 558 | 1,436 | 1,940 |
| මාවරල | (6,108) | (3,653) | 158 | (801) | (1,946) |
| ඇල්පිටිය | (7,990) | (16,604) | (10,105) | (8,994) | (13,298) |
| හිනිදුම | (3,792) | (14,712) | (13,223) | (6,636) | (10,015) |
| බලංගොඩ | (8,527) | (10,316) | (3,821) | (8,157) | (4,813) |
| ගිලීමලේ | (1,991) | (3,593) | (3,148) | (3,671) | (8,645) |
| පන්සල්තැන්න | (2,713)) | (7,943) | (7,010) | (5,725) | (11,015) |
| රයිගම්කෝරලය | (7,579) | 2,191 | 7,670 | 16,977 | 10,712 |
| කොත්මලේ | (6,132) | (8,901) | (11,348) | (6,120) | (7,430) |
| කැප්පෙටිපොල | (1,285) | (5,223) | 1,239 | 10,046 | (4,199) |
| පස්සර | 6,640 | 2,345 | 6,342 | 17,162 | (1,032) |
| මහවැලි | (899) | 245 | (2,738) | 2,345 | 3,265 |
| දැරනියගල | (3,989) * | - | - | - | - |
| යටිනුවර | (3,684)* | | | | |
| | (57,695) | (73,602) | (34,372) | 15,775 | (39,767) |

* මෙම කර්මාන්තශාලා 2012 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ආදායම් උපදවා නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අරමුදලේ ඉහත සදහන් කම්හල් 15 න් 6 ක් 2008 වර්ෂයේ සිට වර්ෂ 5 ක් පුරා අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ පස්සර කම්හල හැර ඉතිරි සියලු කම්හල් අලාභ ලබා තිබුණි.

(ii) 2008 - 2012 සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට හා බුලත්කොහුපිටිය කම්හලින් රු.මිලියන 1.125 ක ලාභයක් අපේක්ෂා කළද 2014 නොවැම්බර් 30 දක්වාම එහි නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ඉහත සඳහන් කම්හල්වලින් හිනිදුම, බලංගොඩ, ගිලීමලේ හා පන්සල්තැන්න යන කම්හල් අලාභ ලැබීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු නවතා දමා තිබුණි. කෙසේ වෙතත් හිනිදුම තේ කම්හලේ කළමණාකරණය ලාභයෙන් 1/3 ක් ලැබීමේ පදනම මත 2012 මැයි සිට සී/ස කළුබෝවිටියාන තේ කම්හලටද, ගිලීමලේ තේ කම්හල 2012 මැයි 17 දින සිට වාර්ෂික බදු පදනම මත කුඩා තේ වතු සංවර්ධන සමිතියකටද, පන්සල්තැන්න තේ කම්හල අදාල බදු කරුටද පවරා තිබුණි.

(iv) බලංගොඩ හා පන්සල්තැන්න යන කම්හල්වල නිෂ්පාදන කටයුතු නවතා දමා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී රු.272,292 ක පැමිණීමේ දිරි දීමනා, රු.1,527,238 ක බැංකු අයිරා පොළී, රු.147.876 ක නිවාස කුළී හා සේවක වන්දි වශයෙන් රු.5,583,190 ක් ඇතුලත්ව රු.7,916,717 ක් වියදම් කර තිබුණි.

**(ආ) තේ නිෂ්පාදිතය**

------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව පසුගිය වර්ෂ 5කට අදාලව එක් එක් කම්හල්වල තේ නිෂ්පාදිතය පහත පරිදි වේ.

| <u>කම්හල</u> | <u>තේ නිෂ්පාදනය කිග්‍රෑ.</u> | | | | |
|---|---|---|---|---|---|
| | **<u>2012</u>** | **<u>2011</u>** | **<u>2010</u>** | **<u>2009</u>** | **<u>2008</u>** |
| දෙනියාය | 218,364 | 269,055 | 310,725 | 320,422 | 362,019 |
| වලහන්දුව | 241,296 | 260,930 | 257,830 | 215,419 | 328,902 |
| මාවරල | 111,197 | 171,257 | 175,756 | 135,765 | 170,915 |
| ඇල්පිටිය | 118,400 | 148,022 | 178,077 | 178,521 | 305,722 |
| හිනිදුම | - | 106,607 | 197,829 | 86,080 | 117,190 |
| බලංගොඩ | - | 74,290 | 189,991 | 30,799 | 236,181 |
| ගිලීමලේ | - | - | - | 253 | 103,656 |
| පන්සල්තැන්න | - | 104,900 | 89,478 | 89,759 | 237,718 |
| රයිගම්කෝරලය | 300,603 | 400,380 | 348,710 | 373,228 | 415,690 |
| කොත්මලේ | 99,199 | 200,027 | 103,042 | 170,888 | 306,975 |
| කැප්පෙටිපොල | 261,056 | 243,507 | 273,322 | 266,069 | 335,648 |
| පස්සර | 290,487 | 307,929 | 328,441 | 364,673 | 417,012 |
| මහවැලි | 351,989 | 458,806 | 301,755 | 381,466 | 749,879 |
| දැරණියගල | 40,599 | - | - | - | - |
| එකතුව | 2,033,190 | 2,745,710 | 2,754,956 | 2,613,342 | 4,087,507 |

(ii) කැප්පෙටිපොල හැර ඉතිරි සියළුම කම්හල්වල නිෂ්පාදනය පහත වැටී තිබුණු අතර පසුගිය වර්ෂය හා සැසදීමේ දි කම්හල් වල සමස්ත නිෂ්පාදිතය සියයට 26 කින් පහත වැටී තිබුණි. දෙනියාය, ඇල්පිටිය හා පස්සර යන කම්හල්වල නිෂ්පාදිතය 2008 වර්ෂයේ සිට වර්ෂ පහක් පුරා අඛණ්ඩව පහත වැටී තිබුණි.

(iii) වාර්ෂිකව කම්හල් වලින් ලැබෙන ලාභය වැඩිකර ගනිමින් අරමුදලේ අරමුණු කරා ළඟාවීම පිණිස කම්හල් අංශය මෙහෙයවීමට ආයතනය අපොහොසත් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තා අනුව තේ නිෂ්පාදනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කම්හල | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක ගත තේ නිෂ්පාදනය | තථ්‍ය තේ නිෂ්පාදනය | විචලනය | යන්ත්‍ර ධාරිතාවය | යන්ත්‍ර උපයෝජනය | ඌන උපයෝජනය |
|---|---|---|---|---|---|---|
| | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | ප්‍රතිශතය | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | ප්‍රතිශතය |
| දෙනියාය | 379,260 | 218,364 | (42.4) | 2,352,000 | 1,074,155 | 54.3 |
| වලහන්දූව | 731,430 | 241,296 | (67.0) | 4,536,000 | 1,168,658 | 74.2 |
| මාවරල | 433,440 | 111,197 | (74.3) | 2,688,000 | 537,241 | 80.0 |
| ඇල්පිටිය | 595,980 | 118,400 | (80.1) | 3,696,000 | 558,006 | 85.0 |
| රයිගම්කෝරලය | 595,980 | 300,603 | (49.6) | 3,696,000 | 1,446,959 | 61.0 |
| දැරණියගල | 296,932 | 40,599 | (86.3) | 1,800,000 | 192,832 | 89.2 |
| කොත්මලේ | 379,260 | 99,199 | (73.8) | 2,252,000 | 442,018 | 80,3 |
| කැප්පෙටිපොල | 541,800 | 261,056 | (51.8) | 3,360,000 | 1,204,787 | 64.1 |
| මහවැලි | 650,160 | 351,989 | (45.9) | 4,032,000 | 1,601,808 | 60.2 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අපේක්ෂිත තේ නිෂ්පාදනයට වඩා තථ්‍ය නිෂ්පාදනය ඉතා අඩු මට්ටමක පැවති අතර එහි විචලනය සියයට 42 සිට සියයට 86 දක්වා පරාසයක විය.

(ආ) ඉහත තොරතුරුවලට අනුව සමස්ථ කම්හල් පද්ධතියේම යන්ත්‍ර ඌන උපයෝජිත මට්ටමක පැවති අතර ඇතැම් කම්හල්වල එය සියයට 90 කට ආසන්න මට්ටමක පැවතුණි.

**(ඇ) දේශීය තේ අලෙවි අංශය**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට දේශීය තේ අලෙවි අංශයෙන් රු. මිලියන 5 ක ලාභයක් අත්කර ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් පසුගිය වර්ෂ 6 ක සිට එය අලාභ ලබමින් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අලාභය රු. මිලියන 15.84 ක් විය. පසුගිය වර්ෂය හා සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ ලාභය රු. මිලියන 0.95 කින් හෙවත් සියයට 105 කින් අඩුවී තිබුණි.

**(ඇ) පොහොර අංශය**

පොහොර අංශයේ ලාභාලාභ ගිණුමට අනුව සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 13.93 ක ලාභයක් ලබා තිබුණු අතර එය පෙර වර්ෂය හා සැසඳීමේදී රු. මිලියන 5.72 ක හෙවත් සියයට 29 ක පහත යාමකි. තවද පොහොර විකිණීමෙන් ලද ආදායමද පසුගිය වර්ෂය හා සැසඳීමේදි රු.මිලියන 42.76 කින් හෙවත් සියයට 46 කින් අඩුවී තිබුණි.

**(ඉ) සුභ සාධන අංශය**

**------------------**

සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිලාභීන් 745 දෙනෙකුට රක්ෂණ වන්දි වශයෙන් රු. 16,177,732 ක් ගෙවා තිබුණි. රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය සඳහා වර්ෂයේදී සාමාජිකත්වය ලැබූ සාමාජිකයින් 66 දෙනෙකු ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට මුළු සාමාජික සංඛ්‍යාව 140,368 ක් විය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් හා බැංකු

-----------------

(i) තේ ශක්ති අරමුදලේ කුඩා තේ වතු සමිති සාමාජිකයන්ගේ ශුභ සාධන අරමුදලින් තේ ශක්ති කම්හල්වල පවතින මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීමට 2000 සිට 2003 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 118.3 ක් කම්හල්වලට ලබාදී තිබුණද, කම්හල් අක්‍රීයව පැවතුණු නිසා එම ණය මුදල් සුභ සාධන අරමුදල වෙත පියවා නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට කම්හල් 04 ක් වසාදමා තිබුණු අතර එම කම්හල්වලට දුන් ණය පියවා ගැනීම සම්බන්ධයෙන්ද ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ii) අරමුදලට අයිතිව වාසිදායක ශේෂයන් තිබුණු රු.16,205 ක බැංකු ගිණුමක් සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිටද, රු. 58,186 ක් තිබුණු බැංකු ගිණුම් දෙකක් 2009 වර්ෂයේ සිටද,වටිනාකම රු. 223,447 ක් තිබුණු බැංකු ගිණුම් තුනක් වර්ෂ 05 කට වැඩි කාලයක සිටද,අක්‍රීයව පැවතුනත් ඒ සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.මිලියන 83.44 ක ස්ථාවර තැන්පතු පැවතියද අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේදී ලබාගත් බැංකු අයිරා පහසුකම් වෙනුවෙන් රු.මිලියන 8.49 ක් පොළිය වශයෙන් ගෙවා තිබුණි. එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී රු.මිලියන 4. 17 ක වැඩිවීමකි.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි

------------------------

(i) අරමුදලේ ආරම්භයේ සිට පැවති ඇල්පිටිය, හිනිදුම, රයිගම්කෝරලය යන කම්හල් ගොඩනැගිලි සහ හොරණ පොහොර ගබඩා ගොඩනැගිල්ලේ පිරිවැය රු. 62,391,999 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු අතර ඒවායෙහි අයිතියද පවරා ගැනීමට අරමුදල විසින් 2014 නොවැම්බර් 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ii) අරමුදලේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වසර 50 ක බදු පදනම මත රු.මිලියන 28 ක් වටිනා පර්චස් 40 ක බිම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගැනීමට එකඟ වී රු.8,082,256 ක් 2010 මාර්තු

31 දින අත්තිකාරම් ලෙස එම අධිකාරියට ගෙවා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව එම ගොඩනැගිල්ල වෙනත් ස්ථානයක ඉදිකිරීමට යෝජනා වී තිබුණු අතර නාගරික සංවර්ධන අධිකාරියට ගෙවූ ඉහත අත්තිකාරම් මුදල් 2014 නොවැම්බර් 30 දක්වාම ආපසු ලබාගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයේදී වාර්ෂික බදු පදනම මත පවරා දී තිබුණු හිනිදුම හා ගිලිමලේ කම්හල්වල වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි .

(iv) 2002 සැප්තැම්බර් 18 දින පන්සල්තැන්න තේ කම්හල අරමුදල යටතට පවරා ගැනීම සඳහා දෙපාර්ශවය විසින් ගිවිසුමකට එළඹ තිබුණු නමුත් කම්හල නැවත භාරදෙන තුරුත් (2012 පෙබරවාරි 19 දින) බදු ගිවිසුම් ලියාපදිංචි කර නොතිබුණි. ගිවිසුම් කාලය තුළ කම්හලේ සිදුකළ නවීකරණයක් සඳහා රු.7,664,603 ක් අරමුදල විසින් දරා තිබුණු බව අදාල ලිපිගොනුවල සඳහන් වුවද අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳව ගිවිසුමේ කොන්දේසි ඇතුළත් වී නොතිබීම හේතුවෙන් එකී වියදම් ආයතනයට අයකර ගැනීමට නොහැකිවීම සිදුවූ අලාභයක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(v) 2011 අගෝස්තු සිට නිෂ්පාදන කටයුතු නවතා දැමූ බලංගොඩ තේ ශක්ති කම්හලේ තිබූ වත්කම් වලින් වැඩි කොටසක් දැරණියගල කම්හලටද ඇතැම් වත්කම් අනෙකුත් කම්හල් වලටද මාරුකර තිබුණද එකී කම්හලේ තිබූ ට්‍රැක්ටරයක්, ටේලරයක්, කසල තේ බෑග් 4,722 ක්, OPI වර්ගයට අයත් ඇසුරුම් කළ තේ බෑග් තොගයක් ,තේ ඇසුරුම් කවර හා කසල තේ විශාල ප්‍රමාණයක්, යන්ත්‍ර සූත්‍ර හා ගලවන ලද යන්ත්‍ර අමතර කොටස්, වසර කිහිපයක සිට පවතින පොහොර තොගයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන කම්හල් පරිශ්‍රයේ දිරාපත් වෙමින් පැවතුණි.

(vi) කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මත බලංගොඩ කම්හල වසා දැමීමෙන් පසු එහි තිබුණු දේපල වලින් වැඩි ප්‍රමාණයක් අනවසර පදිංචි කරුවන් අත්පත් කරගෙන ස්ථිර ගොඩනැගිලි ඉදිකර තිබීම සම්බන්ධයෙන් නඩුවක් බලංගොඩ දිසා අධිකරණයේ විභාග වෙමින් පැවති බව විගණනයේදී හෙළිදරව් වූ අතර එහි තිබුණු ගොඩනැගිලි නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් කම්හලට අයත් නිල නිවාසය හා වැසිකිළි පද්ධතියද විනාශ වෙමින් පැවති බව නිරීක්ෂණය විය. මෙම කම්හලට අයත් වටිනාකම රු. 23,705, 431 ක ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ හා වෙනත් උපකරණ කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුනි.2014 පෙබරවාරි 03 දිනැති තක්සේරු වාර්තාවට අනුව ඉහත කී ඉඩමේ හා ගොඩනැගිලිවල වෙළඳපල වටිනාකම රු.22,500,000 ක් ලෙස තක්සේරු කර තිබුණි.

(vii) හිනිදුම තේ ශක්ති කම්හලේ කළමනාකරණ කටයුතු 2012 ජුනි 01 දින සිට වර්ෂ 25 කට සී/ස කලුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට පැවරීමට දෙපාර්ශවය විසින් එකගතා ගිවිසුමකට එළඹුණත් එම ඉඩමේ අයිතිය අරමුදල සතු නොවන බව හෙළිදරව් වූ බැවින් එකී ගිවිසුමේ නීත්‍යානුකුලභාවය මතභේදයට තුඩුදෙන්නක් විය. තවද කම්හල ඉහත සමාගම වෙත භාරදීමෙන් පසු අරමුදලේ අවසන් ගිණුම් පිළියෙල කර තිබුණු අතර වාර්ෂික ක්ෂය ලෙස ගිණුම් වලට ගෙන තිබුනේ කම්හල භාර දීමට පෙර මාස 05 ක කාල පරිච්ජේදයට අදාල රු.1,187,020 ක ක්ෂය පමණි. ඉතිරි මාස 07 ට අදාල සඳහා රු.1,661,829 ක ක්ෂය සමාගමෙන් අයකරගත යුතු මුදලක් ලෙසට ගිණුම් වල සඳහන් වුවත් ඒ සම්බන්ධ තොරතුරු ගිවිසුමේ සඳහන් නොවීය.

**(ඈ) පරිගණක හා මෘදුකාංග**

---------------------------

අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා සියලුම කම්හල් ඒකාබද්ධව ගිණුම් සැකසීම සඳහා වටිනාකම රු. 2,435,000 ක් වූ පරිගණක මෘදුකාංග 2010 වර්ෂයේදී මිලදීගෙන තිබුණද එම පද්ධතිය භාවිතා කර ගිණුම් සැකසීමේ කටයුතු 2014 නොවැම්බර් 30 දක්වා සිදුකර නොතිබුණි. කම්හල්වලට අයත් පරිගණකවල වටිනාකම ස්ථාවර වත්කම් ලේඛණයේ අදාල කම්හල් යටතේ නොදක්වා ප්‍රධාන කාර්යාලය යටතේ දක්වා තිබුණි.

## 3.3 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී රුසියානු ලංකා බද්ධ ගිවිසුම යටතේ රුසියාවට අපනයනය කළ තේ තොගයකට ලැබිය යුතු රු.මිලියන 19.9 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගිණුම් වලින් ලියාහැර තිබුණි.

(ආ) පොහොර තොග ඇණවුම් කිරීමේදී දළු හිමියන්ගේ පොහොර ඉල්ලුම සැලකිල්ලට නොගෙන පොහොර ඇණවුම් කිරීම හේතුවෙන් කොත්මලේ හා මහවැලි කම්හල්වල පොහොර කල් ඉකුත් වීම නිසා පිළිවෙළින් රු.39,248 ක් හා රු.114,946 ක අලාභ සිදුවී තිබුණි.

(ඇ) පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව අදාල දිනයන්හිදී පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් 2012 වර්ෂය තුල රු. 204,934 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි.

(ඈ) භෞතික තොග සත්‍යාපන වාර්තාවල සඳහන් පරිදි සමාලෝචිත වර්ෂයේ අවසානයට තේ වාඩියෙහි තේ කිලෝග්‍රෑම් 369 කින් යුත් තේ පැකට් 1,574 ක්ද දේශිය තේ අලෙවි අංශයේ BOP Finings (tea bulk) කිලෝග්‍රෑම් 509 ක්ද කල් ඉකුත් වූ තේ තොග බව නිරීක්ෂණය විය.

## 3.4 මානවසම්පත් කළමණාකරණය

-----------------------------------

අරමුදල විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට අරමුදලේ අනුමත කාර්යමණ්ඩලය 89 ක් වූ අතර සාමුහික ගිවිසුමට අනුව තේ කම්හල් 09 ක් සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය 170 ක් විය. සමස්ථ කාර්ය මණ්ඩලයෙන් ප්‍රධාන කාර්යාලයේ තනතුරු 27 හා කම්හල් කාර්ය මණ්ඩලයේ තනතුරු 62 ක් පුරප්පාඩුව පැවති අතර, මෙයට මාණ්ඩලික නිලධාරීන් 14 ක් හා කම්හල් අංශයේ තාක්ෂණ නිලධාරීන් 20 ක් ඇතුළත් විය.

**3.5.** වාහන පාලනය හා නඩත්තුව

----------------------------

විගණනයට ලැබුණු තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලේ වාහන 44 කින් යුත් වාහන ඇනිය සම්බන්ධයෙන් (ට්‍රැක්ටර්, ටේලර්, ලොරි රථ ඇතුලත්ව) පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ ස්ථාවර වත්කම් උපලේඛනයේ දැක්වෙන ධාවන තත්ත්වයේ පවතින හෝ අලුත්වැඩියාකර ධාවනයට ගත හැකි වටිනාකම රු.14,885,880 ක වාහන 23 ක් අරමුදලට පවරා ගැනීමට 2014 නොවැම්බර් 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) වාහන ඇනියට ඇතුළත්ව ඇති අරමුදලට අයත් නොවූ අලුත්වැඩියා කර ධාවනයට ගත නොහැකි දෙනියාය,කැප්පෙටිපොල,කොත්මලේ යන කම්හල් වලට අයත් වාහන 09 ක් අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට වූ ස්ථාවර වත්කම් උපලේඛනයේ දැක්වෙන බලංගොඩ,මහවැලි,මාවරල හා රයිගම්කෝරලය යන කම්හල් යටතේ දැක්වෙන වටිනාකම රු. 2,862,921 ක ට්‍රැක්ටර්,ටේලර්, ලොරි රථ හා අත් ට්‍රැක්ටර් ඇතුළු වාහන 09 ක් වාහන ඇනියට ඇතුළත්ව නොතිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1** **සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ප්‍රකාරව සංයුක්ත සැලැස්මට ඇතුළත්විය යුතු අරමුදලට අදාළ ප්‍රවර්තන සම්පත්, සංවිධාන සැලැස්ම, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා උපායශීලී සැළැසුම්, සැළැසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ ලඟා කරගනු ලබන අරමුණු හා ඉලක්ක පැහැදිලිව සඳහන් කරමින් ඒ ඒ කළමනාකරුවන් වෙත පවරන ලද වගකීම් සහිතව පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන දර්ශක යනාදී ප්‍රධාන කරුණු 2008-2012 කාල පරිච්ඡේදයට අදාළ සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්මේ සඳහන් ලාභදායිත්වය පිළිබඳ ඉලක්ක කරා ලඟා නොවීම

------------------------------------------------------------------------------------

අරමුදලේ කොටස් හිමියන්ගේ ආර්ථික ප්‍රතිලාභ වැඩිකිරීම සඳහා වාර්ෂිකව කම්හල්වලින් ලැබෙන ලාභය 2012 වර්ෂය වනවිට රු.මිලියන 150 දක්වා වර්ධනය කිරීමටත්, දේශීය තේ අලෙවි අංශයෙන් ලැබෙන ලාභය සෑම වසරකම රු.මිලියන 01 කින් වැඩිකිරීමටත් අරමුණු කරගෙන තිබුණු නමුත් 2009 වර්ෂයේ සිට කම්හල් ලාභය වසරින් වසර අඩුවෙමින් පැවති අතර දේශීය තේ අලෙවි අංශය 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අලාභ ලබමින් පැවතුණි.

සාමාජික කොටස් හිමියන්ගේ කොටස් ප්‍රාග්ධන වටිනාකම ඉහළදැමීම මගින් කුඩාතේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ පැවැත්මේ අභිවර්ධනයට කැපවූ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම ආයතනයේ දැක්ම වුවත් ඉහත සඳහන් කරුණු අනුව එම අරමුණ කරා අරමුදල ලඟා වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, වසර 05 කට වැඩි කාලයක සිට අරමුදලේ සාමාජිකයින්ට කිසිදු ප්‍රතිලාභයක් නොලැබීම හේතුවෙන් 2013 වසර අවසානයට වටිනාකම රු.1,078,910 ක්වූ කොටස් 107,891 ක් කොටස්කරුවන් විසින් අරමුදල වෙත නැවත පවරා දී තිබුණි.

**4.2 අයවැය ලේඛනමය පාලනය**

-----------------------------

අරමුදලේ අයවැය ලේඛනයට අනුව අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මුදල් පාලනය
(ඇ) කර්මාන්තශාලා මෙහෙයුම්
(ඈ) වත්කම් කළමණාකරණය
(ඉ) තොග පාලනය